# අ:පො:ස: උසස් පෙළ සඳහා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා දෙන ලද පැවරුම් හා ව්‍යාපෘති භාවිතයෙහි ශක්‍යතාව පිළිබඳ අධ්‍යයනයක්

(පුත්තලම දිස්ත්‍රික්කය ඇසුරින්)

බී. විජේසිරි සෝමරත්න (ලි.ප.අ.-2000/M.phil/16)

(පුහුණු, ශාස්ත්‍රවේදී,(ගෞ)පශ්.උපා.අධ්‍ය.ඩිප්.,ශාස්ත්‍රපති,අධ්‍යාපනපති)

UCLIB
538306

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති පශ්චාත්
උපාධි පරීක්ෂණය සඳහා
ඉදිරිපත් කෙරෙන නිබන්ධනය

## සාරාංශය


අධ්‍යාපනය සියලු දෙනාගේ සාර්ථක දිවි පැවැත්ම සඳහා හේතුවත්තකි. එම ක්‍රියාවලිය පාසල, ගුරුවරයා, පෙළ පොත හා විභාග සහතික තුළින් පමණක් හඳුනාගත නොහැකිය යන පදනම මත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන ලදි. 1998 වර්ෂයේ සිට 12 ශ්‍රේණියටත් 1999 වර්ෂයේ සිට 13 ශ්‍රේණියටත් මෙම ප්‍රතිසංස්කරණ යටතේ පැවරුම් හා ව්‍යාපෘති යන ඉගෙනුම් ක්‍රමවේදයන් දෙකක් හඳුන්වා දෙන ලදි.

අ:පො:සඃ උසස් පෙළට හඳුන්වා දි ඇති වෙනස්කම් අතර සුවිශේෂී ඉගෙනුම් අවස්ථා දෙකක් වන පැවරුම් හා ව්‍යාපෘති භාවිතයේදි අපේක්ෂිත අරමුණු ඔස්සේ ක්‍රියාත්මක කළ හැකි දැයි විමසා බැලීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂිතය. පැවරුම් හා ව්‍යාපෘති භාවිතයෙහි ශක්‍යතාව හා සඵලතාව පිළිබඳ යහපත් නිරීක්ෂණ මේ වනතුරු ලැබී නැත. ලැබෙන ප්‍රතිපෝෂණ පදනම් කරගෙන විධිමත් අධ්‍යයනයක් ද සිදු වී නැත. එසේ නම් ඒ පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් කළ යුතුව ඇත. තවද මෙම විෂය ක්ෂේත්‍රය අළුතින් හඳුන්වාදීමක් නිසා ලැබෙන ප්‍රතිපෝෂණ අධ්‍යාපන පද්ධතියටම වැදගත්ය.

මෙම ක්‍රමවේද හඳුන්වාදීම තුළින් අධ්‍යාපනයේ ප්‍රශස්ත වෙනසක් අපේක්ෂා කළ ද, ඉගෙනුම් පරිසරය එයට අනුකූලව සකස් වී තිබේද? සිසුන්ට, ගුරුවරුන්ට, ගුරුඋපදේශකයින්ට, විදුහල්පතිවරුන්ට හා නියෝජ්‍ය විදුහල්පතිවරුන්ට ඒ පිළිබඳ පුහුණුවක් ලබා දී තිබේද ? දිශාගත කිරීම් ක්‍රමවත්ව සිදුවී තිබේද ? යන්න පිළිබඳ ගැටළු තත්ත්වයක් පිළිබිඹු වීම නිසා මෙම අධ්‍යයනය කිරීමට යොමුවිය.

පවත්නා තත්ත්වය තුළ ශක්‍යතාව කෙබඳුදැයි අර්ථකථනය කිරීමත්, පැවරුම් හා ව්‍යාපෘති භාවිතයේදි ගුරුවරුන්ගේ කාර්යභාරය විවර්ශනය කිරීමත්, පවතින ගැටළු පිළිබඳ විමසා බැලීමත්, මෙම ක්‍රම වේද පිළිබඳ ගුරු සිසු ආකල්ප විමසා බැලීමත්, ගුරුඋපදේශකයින් විදුහල්පති නියෝජ්‍ය විදුහල්පතිවරුන්ගේ ආකල්ප විමසා බැලීමත් සිදුකරන ලදි. මෙම ක්‍රම වේදයන් පාසල් පිරියත සංවර්ධනයට යොදා ගත හැකි

ආකාරය විමසා බැලීමත්, පවත්නා තත්ත්වය තුළ අනාවරණය ඇසුරින් සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කිරීමත් මෙම අධ්‍යයනයෙන් සිදුකෙරිණ.

මෙම අධ්‍යයනයේදී පැවරුම් හා ව්‍යාපෘති භාවිතයේදී ගුරු භූමිකාවෙන් සිසුන්ට ලැබී ඇති සහාය අල්ප බව හෙළි විය. ගුරුවරුන්, ගුරුඋපදේශකයින්, විදුහල්පතිවරුන් හා නියෝජ්‍ය විදුහල්පතිවරුන් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පෙර පුහුණුවක් ලබා නැති බවත් ලබා ඇති පුහුණුව අල්ප බවත්, මේ නිසා පැවරුම් සහ ව්‍යාපෘති භාවිතය සක්‍රිය මට්ටමින් සිදු නොවන බවත්, අනාවරණය විය.